(01) 00215

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2017/2018
LLU5709/LWU3311- පරිපාලන නීතිය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.02.20 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. "මෙම අධිකරණයේ දෛනික කාර්යයක් ලෙස පාර්ලිමේන්තු පනත්වල වලංගු භාවය පරීක්ෂා කිරීමට අපි පුරුදු වී සිටින්නෙමු. බොහෝ විට විධායක ක්‍රියාවක් අපගේ සැලකිල්ලට යොමුවීම අවම වන නමුත්, ඉහත හා සමානවම ඒවාට ද වැදගත්කමක් පවතී."

[R v Richards, Ex parte Fitzpatrick and Browne (1955)92 CLR 157,165]

ඉහත ප්‍රකාශය ඇසුරින්, ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් පරිපාලන ක්‍රියා පිළිබඳ අධිකරණ සමාලෝචන සංකල්පය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 20)

02. සෙරන්ඩිබ් හි ආයුධ සංස්ථාව (Armscor) යනු ආයුධ සංස්ථා පනත මගින් නියාමනය කරනු ලබන රාජ්‍ය හිමිකාරිත්වය සහිත ආයතනයකි. එය (Armscor) සෙරන්ඩිබ් හි ආරක්ෂක දෙපාර්තමේන්තුවට මිලිටරි ද්‍රව්‍ය, උපකරණ, පහසුකම් සහ සේවා සැපයීම සඳහා සංස්ථාපනය කර ඇත. ආයුධ සංස්ථාවේ හිමිකාරිත්වය පාලනය කිරීම රජය විසින් ආරක්ෂක අමාත්‍යාංශය හරහා සිදු කරයි. එහි (Armscor) කටයුතු කළමනාකරණය සහ පාලනය කරනු ලබන්නේ විධායක නොවන සාමාජිකයන් නව දෙනෙකු සහ විධායක සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයකිනි. ආයුධ සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව හිටපු අමාත්‍යවරයා විසින් ජෙනරාල් ඩේවිඩ් මණ්ඩලයට පත් කරන ලදී. විවිධ පරිපාලන ගැටළු විසඳීම සඳහා ඔහුව සභාපතිවරයා ලෙස පත් කර ඇත. අමාත්‍යවරයා මණ්ඩලය සමඟ රැස්වීම් තුනක් කැඳවා ඇති අතර ඒ එකදු රැස්වීමකටවත් ජෙනරාල් ඩේවිඩ් සහභාගී නොවීය. අමාත්‍යවරයා ලිපියක් මඟින් ඔහුට තම අප්‍රසාදය පළ කලේය. ඔහු පිළිතුරු ලෙස ලබා දුන්නේ අමාත්‍යවරයා රැස්වීම් පිළිබඳව ප්‍රමාද වී දැනුම් දී ඇති බවයි. ඔහුට කලින් යොදා ගත් වැදගත් වැඩ කටයුතු තිබූ බැවින් ඒවා අවලංගු කිරීමට තමාට නොහැකි වූ බව දැක්වීය. මණ්ඩලය සමඟ පවත්වන අනාගත රැස්වීම් සභාපති වන තමා හරහා කැඳවන ලෙස ඔහු ඉල්ලා සිටියේ ය.

ආයුධ සංස්ථා පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ලිපියක් මඟින් අමාත්‍යවරයා විසින් ජෙනරාල් ඩේවිඩ් ගේ සාමාජිකත්වය අවසන් කරන ලදී. ඉහත වගන්තියේ මෙසේ සඳහන් වේ. " පිළිගත හැකි සාධාරණ හේතුවක් මත අමාත්‍යවරයා විසින් ඔහුගේ හෝ ඇයගේ සේවය අහෝසි කරන

ලද විටෙක මණ්ඩලයේ සාමාජිකයෙක් සිය ධූරයෙන් ඉවත් විය යුතුය." අමාත්‍යවරයාගේ මතය අනුව ජෙනරාල් ඩේවිඩ් දෙපාර්තමේන්තුවේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කර නොමැති බවත් මේ හේතුවෙන් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ඔහුගේ සේවය අවසන් කර ඇති බවත් ජෙනරාල් ඩේවිඩ් වෙත යැවූ ලිපියක් මගින් තව දුරටත් පැහැදිලි කර ඇත.

සෙරන්ඩිබ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න. ඉහත තත්ත්වයට අදාල නීතිමය කරුණු සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ අධිකාරීන් මඟින් තහවුරු කරන්න. (ලකුණු 20)

03. යුක්තියට ප්‍රවේශය ව්‍යාපෘතිය යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශවල පරිපාලන නිලධාරීන් සඳහා වැඩමුළුවක් සංවිධානය කරයි. අමාත්‍යාංශය විසින් විවිධ තේමාවන් හඳුනාගෙන ඇත. ඒවායින් එකක් වන්නේ, "නීතියේ ආධිපත්‍යය සහ පරිපාලන ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවයයි." මේ සඳහා දේශනයක් පැවැත්වීමට සම්පත් දායකයෙකු ලෙස සහභාගීවීමට අමාත්‍යාංශය ඔබට ආරාධනා කරයි.

අදාළ නෛතික අධිකාරීන් වෙත අවධානය යොමු කරමින් ඉහත තේමාව යටතේ ඔබගේ යෝජිත දේශනය පිළිබඳව විස්තරාත්මක සටහනක් සකස් කරන්න. (ලකුණු 20)

04. ලතා, අයිලන්ඩ් රාජ්‍යයේ වයඹ විශ්වවිද්‍යාලයේ, සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හදාරණ ශිෂ්‍යාවකි. ඇය තම නිබන්ධනය බාරදී ඇති අතර එය සම්පාදනය කිරීමේ දී විවිධ මූලාශ්‍ර කිහිපයකින් තොරතුරු පිටපත් කර ඇති බව පරීක්ෂකවරයා සොයා ගත්තේ ය.

පරීක්ෂකවරයා අදාල විශ්වවිද්‍යාල අධිකාරියට මේ පිළිබඳ ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය. ලතාට තොරතුරු සොරකම් කිරීමේ වරදට (Plagiarism) චෝදනා එල්ල වී ඇති අතර 2019 දෙසැම්බර් 17 වන දින චෝදනා පත්‍රය ලබා දෙන ලදී. ඇය 2020 ජනවාරි 2 වන දින විමර්ශන මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු විය. කමිටුව ඉදිරියේ පෙනී සිටීමට තවත් සති දෙකක කාලයක් ලබා දෙන ලෙසත්, ඇගේ නඩුවට පෙනී සිටීම සඳහා නීතිඥවරයෙකු ගේ සහාය ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලෙසත්, ලතා ලිඛිතව කමිටුවෙන් ඉල්ලා සිටියාය.

දෙසැම්බර් 27 වනදා දක්වා ඇයට පිළිතුරක් නොලැබුණු බැවින් ඇය විශ්වවිද්‍යාලයට ගොස් ඇගේ ඉල්ලීම ගැන විමසුවා ය. අනධ්‍යයන වෘත්තීය සමිති වැඩ වර්ජනය 2020 ජනවාරි 14 වනදා සිට ආරම්භ කිරීමට නියමිත බවත්, එය මාස දෙකකට වැඩි කාලයක් පැවතිය හැකි බවත් රෙජිස්ට්‍රාර් වරයා ඇයට දැනුම් දුන්නේ ය. එම නිසා, හැකි ඉක්මණින් පරීක්ෂණය අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට අවශ්‍ය වන බැවින් ඇයට අමතර කාලයක් ලබාදිය නොහැකි බවත් දැක්විය. නීතිඥවරයකු ගේ සහාය ලබා ගැනීම සඳහා ඇය කළ දෙවන ඉල්ලීම ද විමර්ශන මණ්ඩලය විසින් පිළිගනු නොලැබූ බව රෙජිස්ට්‍රාර්වරයා පැවසීය.

මණ්ඩලයේ තීරණයට අභියෝග කළ හැකි පදනම් මොනවාදැයි දැන ගැනීමට ලතාට අවශ්‍ය වේ.

අයිලන්ඩ් රාජ්‍යයේ නීති පද්ධතිය ශ්‍රී ලංකා නීති පද්ධතියට සමාන යැයි උපකල්පනය කරන්න. අදාල නෛතික අධිකාරීන් කෙරෙහි අවධානය යොමු කරමින් ඇයට උපදෙස් ලබා දීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. (ලකුණු 20)

05. රෙස්ටෝරියා රාජ්‍යයේ නිව්ලන්ත නගර සභාවට නගර සභා පනත යටතේ නගර සීමාව තුළ කැළි කසල එකතු කිරීම සඳහා බලය ලබා දී ඇත. නගර සභාව පෙබරවාරි 05 වන දා සිට කසළ එකතු කිරීම නවතා දැමීය. නගරය පුරා ප්‍රදේශ කිහිපයක කසළ ගොඩගැසී තිබුණි. මෙහි පදිංචිකරුවෙක් වන නිහාල්, බලය රූපවාහිනී නාලිකාවට අදහස් දක්වමින් කියා සිටියේ පසුගිය සති දෙකක කාලය තුළ කසළ එකතු කිරීම සිදුනොවන බවයි. පවතින වැසි තත්ත්වයත් සමඟ අකාර්යක්ෂම කසළ බැහැර කිරීම,ඩෙංගු රෝගය පැතිරීම ඇතුළු ප්‍රතිවිපාක කිහිපයකට තුඩු දෙන බව ඔහු පැවසීය.

පදිංචිකරුවන්, වාචික සහ ලිඛිත ඉල්ලීම් කිහිපයක් නගර සභාවට ඉදිරිපත් කර ඇතත් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. පදිංචිකරුවන්ට නීතිමය ප්‍රතිකර්ම ලබා ගැනීමට අවශ්‍ය වේ.

රෙස්ටෝරියා රාජ්‍යයේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරමින්, අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීතිය ඇසුරින් පදිංචිකරුවන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

06. පරිපාලන නීතිය යටතේ, ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ආඥාවල බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. 2019 අප්‍රේල් මාසයේ දී, යුටෝපියා රාජ්‍යයේ අගනගරයේ පිහිටි දේවස්ථාන ත්‍රිත්වයක් සහ සුඛෝපභෝගී හෝටල් ත්‍රිත්වයක් සැලසුම් කරන ලද කරන ලද මරාගෙන මැරෙන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මාලාවකට ගොදුරු විය. පිපිරීම අතරතුර නේවාසික ගොඩනැගිලි කිහිපයකට ද හානි සිදු විය. මෙයින් පීඩාවට පත් පදිංචිකරුවන් රාජ්‍ය අධිකාරීන් සම්පාදනය කළ තාවකාලික වාසස්ථාන වෙත මාරු කරන ලදී. මෙම සිදුවීම් වලින් පසුව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ පනත යටතේ චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර, “2019 අප්‍රේල් මාසයේ ත්‍රස්ත ප්‍රහාරවලින් පීඩාවට පත් පදිංචිකරුවන් වන්දි ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනු ඇතැයි” ඉන් නිවේදනය කර තිබේ. සුදුසුකම් ලත් අපේක්ෂකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගනු ලැබූ තීරණය අවසාන සහ තීරණාත්මක වන අතර එය කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බවට පනතේ විධිවිධාන ඇතුළත් වන වගන්තියක් මෙම චක්‍රලේඛයට ඇතුළත් විය.

පීඩාවට පත් පදිංචිකරුවෙකු වන ජෝන් නියමිත අධිකාරීන් හරහා අයදුම්පතක් අමාත්‍යාංශයට යොමු කළේ ය. මසකට පසු අමාත්‍යාංශය විසින් වන්දි ලබා ගැනීමට සුදුසුකම් ලබන ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කරන ලදී. ඔහුගේ නම ලැයිස්තුවේ නොමැති බව ජෝන් දුටුවේ ය. තමා වන්දි ලැබීමට සුදුසුකම් නොලබන්නේ මන්දැයි ඔහු අමාත්‍යාංශයෙන් විමසීය. ඉහත සඳහන් ත්‍රස්ත ප්‍රහාරයේ ප්‍රධාන සැකකරුවන්ගෙන් එක් අයෙකු වන්නේ ජෝන්ගේ ඥාතිවරයෙකු බවට ඔහුගේ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් පැමිණිල්ලක් ලැබී ඇති බව නිලධාරීහු පැවසූහ. ඔහුගේ අයදුම්පත ප්‍රතික්ෂේප වූයේ මේ හේතුව නිසා බව දැන්වීය.

ඔහුගේ අයදුම්පත නැවත සලකා බලන ලෙස ජෝන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අභියාචනයක් ඉදිරිපත් කළේය. අමාත්‍යවරයාගේ තීරණය අවසාන සහ තීරණාත්මක බව පවසමින් ඔහුට පිළිතුරක් ලැබුණි.

අමාත්‍යවරයාගේ තීරණයට අභියෝග කළ හැකිදැයි දැන ගැනීමට ජෝන්ට අවශ්‍ය වේ.

යුටෝපියා හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරමින් අදාළ විනිශ්චිත තීරණ ඇසුරින් ජෝන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් ඕනෑම දෙකක් **(02)** පිළිබඳව සටහන් ලියන්න.

(අ) පක්ෂපාතීත්වයට එරෙහි රීතිය

(ආ) වාර්තාව මතුපිටින් පෙනී යන නීතිමය වරද

(ඇ) නීත්‍යානුකූල අපේක්ෂාව

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.